සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/05/MF/IN | | 2020.10.19 |

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ -2020/16**

සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමණාකරුවන්,

**<u>Covid-19 හේතුවෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා අතරැදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණය වෙනුවෙන් විශේෂිත ආවරණයක් ලබාදීම</u>**

නැවත covid-19 වසංගත තත්ත්වය උද්ගතවීමත් සමඟ ඇතැම් ප්‍රදේශවලට නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇත. ඇතැම් ප්‍රදේශ වසා දමා ඇත. ( Lock Down ) එසේ වුවද එම ප්‍රදේශවල සමෘද්ධි බැංකු කටයුතු පවත්වාගෙන යාමට සිදුවේ. පෙර Covid- 19 සමයේ මෙන් සහනාධාර මුදල් ගෙවීම හා අනෙකුත් මූල්‍ය ආධාර ලබාදීම සමෘද්ධි ප්‍රජාමූල බැංකු මඟින් කිරීමට සිදුවනු ඇත.

මෙම කරුණු සැලකිල්ලට ගෙන හදිසි තත්ත්වයන් ක්‍රියාත්මක ප්‍රදේශවල අතරැදි මුදල් රක්ෂණ සීමාව රු. මිලියන 2 වඩා අඩුවෙන් පවත්වාගෙන යන සමෘද්ධි ප්‍රජමූල බැංකු සඳහා රු. මිලියන 2 ක අතරැදි මුදල් රකෂණ ආවරණයක් ලබාදේ. දැනටමත් රු. මිලියන 2 ක රක්ෂණ ආවරණය ලබාගෙන ඇති බැංකු සඳහා එම රක්ෂණ ආවරණය ඒ අයුරින්ම ක්‍රියාත්මක වේ.

එම ප්‍රදේශවල ජනතාවට සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත පැමිණීමට නොහැකි වන බැවින් නිලධාරින් ක්ෂේත්‍රයට ගොස් සහනාධාර මුදල් හා අනෙකුත් මූල්‍ය ගෙවීම් කටයුතුවල නිරතවිය යුතුය. එහිදී එම රාජකාරියේ නියුක්ත වන නිලධාරියෙකුට හෝ නිලධාරින් කීපදෙනෙකුට එක් ග්‍රාම නිලධාරි වසමකට වරකට රු. ලක්ෂ 5 ක උපරිම මුදලක් ක්ෂේත්‍රයට රැගෙන යා හැකිය.

එසේ ක්ෂේත්‍රයට ගෙන යන රු. ලක්ෂ 5 ක මුදල සඳහා ද අතරැදි මුදල් රක්ෂණ ආවරණය ලබාදේ. සමෘද්ධි කළමනාකරු සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලයේ නිලධාරින් හා ක්ෂේත්‍ර නිලධාරින් අවශ්‍ය හා සුදුසු පරිදි එම රාජකාරි කටයුතු කළ යුතුය.

ක්ෂේත්‍රයට ගොස් මුදල් ගෙවීම් කටයුතුවල නිරත වන සමෘද්ධි කළමනාකරුට බැංකු කාර්ය මණ්ඩලයට හා ක්ෂේත්‍ර නිලධාරින්ට රාජකාරියේ නියැලෙන කාල සීමාව සඳහා ශාරීරික අනතුරු රක්ෂණ ආවරණය ද ලබාදේ. මෙම රක්ෂණ ආවරණයන් සඳහා වාරික මුදල් අය කිරීමක් සිදුනොවේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

මෙහිදී අතරෑදී මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණය යන්නෙන් ඒ සඳහා නිකුත් කර ඇති දි/ප්‍ර/බැ/2015/02 අංක දරණ චක්‍රලේඛයේ දක්වා ඇති අර්ථ ගැන්වීම් පමණක් අදහස් වේ. මෙම රක්ෂණ සම්බන්ධයෙන් වාරික ගෙවීම හැර අනිකුත් කරුණු එම චක්‍රලේඛයේ සඳහන් පරිදිම වේ.

මෙම විශේෂිත රක්ෂණ ආවරණය ලබාදෙනුයේ covid-19 හේතුවෙන් හෝ වෙනත් හදිසි තත්ත්වයන් ක්‍රියාත්මක වන හා ඉදිරියට ක්‍රියාත්මක කෙරෙන යම් ප්‍රදේශයක් වේ නම් එම ප්‍රදේශවල සමෘද්ධි ප්‍රජාමුල බැංකු සඳහා පමණි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. අධ්‍යක්ෂ- ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස. සහ අ.ක.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
7. අංශ ප්‍රධානීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
8. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
9. සභාපතිවරුන්, බැංකු සමිති විධායක කමිටුව - අ.ක.ස.
10. සභාපතිවරුන්, බැංකු පාලක මණ්ඩල - අ.ක.ස.
11. සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරුවන් - අ.ක.ස.
12. සමෘද්ධි සංවර්ධන නිලධාරින් - අ.ක.ස.